# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018.11.08


**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක: 249/2016 (ii)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම - ගිණුම් තැබීමේ කටයුතු විධිමත් කිරීම**

භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමට අදාළව උක්ත මැයෙන් නිකුත් කරන ලද පහත සඳහන් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

| චක්‍රලේඛ අංකය | දිනය |
| --- | --- |
| 249/2016 | 2016.04.11 |
| 249/2016(i) | 2018.02.19 |

02. 2018 අංක 13 දරණ ජාතික විගණන පනතේ 15 වන රෙගුලාසිය ප්‍රකාරව ජනරජයේ ගිණුම විගණනය සඳහා විගණකාධිපති වෙත එළැඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු බැවින් වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ ගිණුම් ඇතුළු විගණනය කරනු ලබන අස්ථිත්වයන්හි ගිණුම් හා මූල්‍ය ප්‍රකාශ ද නිශ්චිත කාලරාමුවක් තුළ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුවේ. මෙම කාර්යයේදී සියලු අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/දිස්ත්‍රික් ලේකම් කාර්යාල සිය මූල්‍ය ප්‍රකාශ හා ගිණුම් එළැඹෙන වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර සකසා අවසන් කළ යුතු ය.

03. එබැවින්, ඉහත චක්‍රලේඛයේ අනෙකුත් කරුණු නොවෙනස්ව 03 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

"ඒ අනුව, සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම් කර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර **පසුව එළඹෙන වර්ෂයේ පෙබරවාරි 28** දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය".

04. මෙම සංශෝධනය 2019.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

කේ.ඩී.ආර්. ඕල්ගා
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk